# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,873 - 2014 ජූලි මස 25 වැනි සිකුරාදා - 2014.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 930 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 936 |


*සැ. යු.* - ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත 2014 ජුනි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|
| 02 | රියදුරු | 02 | (රා.ප.ච. 6/2006 IV) PL-3-2006A රු.12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 | 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයන් හැර)<br>2. දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයක ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත්වේ.<br>3. තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි.<br>4. වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සේවා සහතික මගින් සනාථ කළ යුතුවේ.) |
| 03. | පුස්තකාල සහායක | 02 | (රා.ප.ච. 6/2006 IV) PL-1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - රු.17,600 | අ.පොස.(සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුයි. වෛකල්පිත විෂයන් හැර) |
| 04. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | (රා.ප.ච. 6/2006 IV)PL-1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - රු. 17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයන් හැර) |

2. *අවශ්‍ය වෙනත් සුදුසුකම් ඃ*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතු යි.)
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු යි. (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු යි.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රජයේ /පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුයි.

3. *බඳවා ගැනීමේ ක්‍රමය ඃ-*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

2. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
4. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

4. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. සියළුම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.
3. බඳවාගනු ලබන තැනැත්තන් වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතුයි.
5. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාතේ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

5. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014.08.11 වැනි දින හෝ ඊට ප්‍රථම "ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.

3. අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.

   * උප්පැන්න සහතිකය ;
   * අධ්‍යාපන සහතික ;
   * තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
   * මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුයි.);
   * වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2014 ජූලි මස 03 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. (i) අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :——————————.
   (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.

2. ස්ථිර ලිපිනය :——————————.

3. (i) උපන් දිනය : අවුරුද්ද :—————, මාසය :—————, දිනය :—————.

   (ii) 2014.08.11 දිනට වයස : අවුරුදු :—————, මාස :—————, දින :—————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

6. විවාහක/අවිවාහක බව :——————————.

7. ජාතිය :——————————.

8. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :——————————,

9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————,

10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————————,

(i) සමත් වූ වසර/ශ්‍රේණිය :——————————, වර්ෂය :——————————,
(ii) අ.පොස. (සා.පෙළ) විභාගය:

විභාග අංකය :——————————, වර්ෂය :——————————,

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(iii)අ.පොස. (උ.පෙළ) විභාගය:

විභාග අංකය :——————————, වර්ෂය :——————————,

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————,

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා කාලය සහ විස්තර :——————————,

13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? :——————————,

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————,

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත්, දැනට -—————————————— වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

——————————,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

දිනය :——————————,

07-639

## පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *බඳවා ගැනීමේ ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික) (රා.ප.ච. 6/2006 IV අනුව)* | *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | කාර්යාල කාර්ය සහායක | ශිල්පීය නොවන III | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160- රු. 17,600 (පී. එල්. 1-2006 ඒ) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>(i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් සමත්වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර)<br>(ii) 2008.11.19 වැනි දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ. |
| 02. | මුරකරු | ශිල්පීය නොවන III | 02 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160- රු. 17,600 (පී. එල්. 1-2006 ඒ) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>(i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් සමත්වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර)<br>(ii) 2008.11.19 වැනි දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළවේ. |
| 03. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | ශිල්පීය නොවන III | 02 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160- රු. 17,600 (පී. එල්. 1-2006 ඒ) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>(i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br>(ii) 2008.11.19 වැනි දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළවේ. |
| 04. | සෞඛ්‍ය කම්කරු | ශිල්පීය නොවන III | 03 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160- රු. 17,600 (පී. එල්. 1-2006 ඒ) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. | *අධ්‍යාපන සුදුසුකම් :*<br>(i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br>(ii) 2008.11.19 වැනි දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

(iii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. (පදිංචිය වසමේ ග්‍රාම නිළධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සහතික කර තිබිය යුතු ය.)

(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (එහෙත් දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(v) දැනටමත් ප්‍රාථමික ශිල්පීය හා අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට, ඔවුන්ට පමණක් පෞද්ගලික වනසේ උපරිම වයස් සීමාවක් බල නොපැවැත්වේ. (අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමට පත්වීම අවුරුදු 18ත් 45ත් අතර සිදුවිය යුතුය.)

(vi) අයදුම්කරුවන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

(vii) දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ඔහු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර එකී පූර්වාසන්න වසර 5ක් තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මෙම තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් පසු සුදුසුකම් ලත් අයදුම්කරුවන් අදාළ තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥා පනත්/පනත් වල විධිවිධාන වලට ද, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. :

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2014.08.25 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව පොල්ගහවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "..................... තනතුර සඳහා අයදුම්පත" (තනතුරේ නම) යනුවෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එකක් ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුය.).

ජේ. එම්. නිමල් ජයසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පොල්ගහවෙල.

2014 ක්වූ ජූලි මස 09 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභා කාර්යාලය,
පොල්ගහවෙල.

## ආදර්ශ අයදුම්පත්‍රය

### පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

***වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2014***

***........................................................................................ තනතුර සඳහා අයදුම්පත***

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි කාලය :——————.
05. උපන් දිනය: වර්ෂය :——————., මාසය:——————., දිනය:——————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ——————. මාස :——————. දින:——————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :____________.
08. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————.
09. විවාහක/අවිවාහක බව:——————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————.
11. අධ්‍යාපන සුදුසුකම් :- සමත්වූ විභාග පිළිබඳ විස්තර :——————.
    (සහතිකවල ඡායා පිටපත් අමුණන්න)
12. වෘත්තීය සුදුසුකම්: (සහතික මගින් සනාථ කළ යුතුය.) : ——————.
13. සේවා පළපුරුද්ද : ——————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? : ——————.
15. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය පිළිබඳ විස්තර : ——————.
    එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/තාවකාලික) : ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

____________,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

***දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය***

මෙම අයදුම්කරු වන ...................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය මොනම ආකාරයෙන් හෝ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5 තුළදී විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද, එකී පූර්වාසන්න වසර 5 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බව ද මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

______________,
දෙපාර්තමේන්තුව/ආයතනයේ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම : ——————.
පදවි නාමය : ——————.
දෙපාර්තමේන්තුව : ——————.
දිනය : ——————.

07-795

# විවිධ දැන්වීම්

## බදුල්ල මහ නගර සභාව

### බදුල්ල මහ නගර සභා සීමාව තුළ මෝටර් රථවාහන නවතා තැබීම වෙනුවෙන් අයකරන ගාස්තු සංශෝධනය කිරීම

252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වැනි හා 272 වැනි වගන්ති යටතේ බදුල්ල මහා නගර සභාව විසින් 1981 ජුනි මස 17 වැනි දින අංක 150 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද මෝටර් රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා 1991 ජනවාරි මස 04 වැනි දින අංක 644 දරන *ගැසට් පත්‍රයෙන්* හා 2009 ඔක්තෝබර් මස 09 වැනි දින අංක 1623 දරන *ගැසට් පත්‍රයෙන්* සංශෝධනය කර පළ කරන ලදුව, එම අතුරු ව්‍යවස්ථාවල පහත සඳහන් කරුණු නැවත සංශෝධනය කරමින් හා නව වගන්ති එකතු කරමින් අදාළ ගාස්තු අය කිරීමට තීරණය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීතිඥ උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
බදුල්ල මහා නගර සභාව.

2014 මැයි මස 21 වැනි දින,
බදුල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

01. එහි 3 (ඇ) ඡේදය යටතේ ඇති ලේඛනගත කිරීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය කෙරේ.

| | | *ලේඛන ගත කිරීමේ ගාස්තු රු. ශත* |
|---|---|---|
| (අ) | ලොරි රථයක් සඳහා ගාස්තු | 200 0 |
| (ආ) | බස් රථයක් සහා ගාස්තු | 200 0 |
| (ඇ) | වෑන් රථයක් සඳහා ගාස්තු | 200 0 |
| (ඈ) | ට්‍රැක්ටරයක් සඳහා ගාස්තු | 200 0 |
| (ඉ) | මෝටර් කාරයක් හෝ ත්‍රී රෝද රථයක් සඳහා | 100 0 |
| (ඊ) | අනෙකුත් සියළුම වාහන සඳහා ගාස්තු | 100 0 |

ඉහත වාහනවලට අමතරව දෛනික අවශ්‍යතාවයන් සඳහා පැමිණ බදුල්ල මහා නගර සභා සීමාව තුළ නවතා තබන සෑම වාහනයක් සඳහාම (අ) උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවා අවසර පත්‍ර ලබාගත යුතුවේ.

02. එහි 4 වන ඡේදය යටතේ අයකරන මාසික ගාස්තු පහත පරිදි සංශෝධනය කෙරේ.

| | | *රු. ශත* |
|---|---|---|
| (අ) | මගී බස් රථයක්/ලොරි රථයක් සඳහා ගාස්තු | 500 0 |
| (ආ) | මෝටර් රථයක් හෝ වෑන් රථයක් සඳහා ගාස්තු | 400 0 |
| (ඇ) | ත්‍රී රෝද රථයක් සඳහා ගාස්තු | 300 0 |
| (ඈ) | මෝටර් සයිකලයක් සඳහා ගාස්තු | 100 0 |
| (ඉ) | ට්‍රැක්ටරයක් සහිත ටේලරයක් සඳහා ගාස්තු | 400 0 |

03. එහි 05 වැනි ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන්

බදුල්ල මධ්‍යම බස් නැවතුම්පල වෙත මගී ප්‍රවාහනය සඳහා දෛනිකව ඇතුලත් කරනු ලබන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථ සහ පෞද්ගලික බස් රථවලින් සෑම බස් රථයක් සඳහාම බස් නැවතුම්පල වෙත ඇතුලත් කිරීමේ ගාස්තුව වශයෙන් බදුල්ල මහ නගර සභාව සමගින් එකඟතාවයකට පැමිණ ඇති ආකාරයකින් දිනකට රු. 50ක් වන සේ ගාස්තු ගෙවා අවසර පත්‍රයක් ලබා ගත යුතු ය.

04. එහි 06 යටතේ ඇති ඡේද වෙනුවට පහත ඡේද ඇතුලත් කිරීමෙන්.

(අ) ඒ වරද පළමු වරට කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් දහස නොඉක්මවන දඩයකින්

(ආ) ඒ වරද දෙවන වරට හෝ තදනන්තරව කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් එක්දහස් පන්සීය නොඉක්මවන දඩයකින්

(ඇ) ඒ වරද දිගටම කරනු ලබන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කිරිමෙන් පසුව හෝ එම කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නගරාධිපතිවරයාගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව වරද දිගටම කරනු ලබන සෑම දවසක්ම සඳහා රුපියල් දෙසීය නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

05. එහි 07 ඡේදයෙහි අ ආ ඇ උපලේඛන වෙනුවට පහත උපලේඛණ ආදේශ කිරීමෙන්

*(අ) උපලේඛනය*

| | | *පළමු පැය හෝ ඉන් කොටසක් සඳහා රු. ශත* | *අතිරේක සෑම පැය 01ක් හෝ ඉන් කොටසක් සඳහා රු. ශත* |
|---|---|---|---|
| 1. | ලොරියක්/බස් රථයක් සඳහා | 50 0 | 50 0 |
| 2. | ට්‍රැක්ටරයක්/ට්‍රේලරයක් සඳහා | 25 0 | 25 0 |
| 3. | මෝටර් වෑන් රථයක් හෝ කෝච් රථයක් සඳහා | 25 0 | 25 0 |
| 4. | ත්‍රී රෝද රථයක් සඳහා | 25 0 | 25 0 |
| 5. | මෝටර් සයිකලයක් සඳහා | 20 0 | 20 0 |

*(ආ) උපලේඛනය*

බදුල්ල මහ නගර සභාව මගින් නම් කොට ඇති කුළී රථ ගාල් සඳහා මාසික ගාස්තු

| | | *රු. ශත* |
|---|---|---|
| 1. | මෝටර් රථයක්, කෝච් රථයක් හෝ මෝටර් වෑන් රථයක් සඳහා | 500 0 |
| 2. | මගී බස් රථයක් සඳහා ආසන 30-50 | 1,000 0 |
| 3. | මගී බස් රථයක් සඳහා ආසන 10-30 | 500 0 |
| 4. | ට්‍රැක්ටරයක්/ට්‍රේලරයක් සඳහා | 500 0 |
| 5. | ත්‍රී රෝද රථයක් සඳහා | 500 0 |
| 6. | ලොරි රථ | |
| | (i) කියුබ් 3 ටිපර් කල හැකි ලොරි රථයක් සඳහා | 500 0 |
| | (ii) කියුබ් 2 හෝ ඊට අඩු ටිපර් කල හැකි ලොරි රථයක් | 500 0 |
| | (iii) කියුබ් 1.5 හෝ 1.0 ටිපර් කල හැකි ලොරි රථයක් සඳහා | 400 0 |
| | (iv) කියුබ් 1.0ට අඩු ටිපර් කල හැකි ලොරි රථයක් සඳහා | 300 0 |

*(ඇ) උපලේඛනය*

01. බදුල්ල මහ නගර සභාවේ අනුමත ත්‍රී රෝද රථ ගාල් ලේඛනය

| *අනු අංකය* | *රථ ගාලේ අංකය* | *රථ ගාලේ නම* |
|---|---|---|
| 1 | 1 | පිලීපොත ගම පාර ආරම්භය |
| 2 | 2 | හෙද විදුහල ඉදිරිපිට |

| අනු. අංකය | රථ ගාලේ අංකය | රථ ගාලේ නම |
|---|---|---|
| 3 | 3-A | වෙළේ කඩේ |
| 4 | 3-B | වෙළේ කඩේ |
| 5 | 4 | සායන පාර |
| 6 | 5 | පුස්තකාල මාවත |
| 7 | 6 | රජවීදිය රෆීක්ස් වෙළඳ සැල අසල |
| 8 | 7 | තානායම පැති ගේට්ටුව අසල |
| 9 | 8 | ආණ්ඩුකාර කාර්යාලය හා ප්‍රධාන අමාත්‍ය නිළ නිවස ඉදිරිපිට |
| 10 | 9 | තැපැල් හල පාර - ඉහල |
| 11 | 10-A | දකුණු පටු මාවත - සිල්වා හෝටලය ඉදිරිපිට |
| 12 | 10-B | දකුණු පටු මාවත - රහුමනියා හෝටලය අසල |
| 13 | 10-C | දකුණු පටු මාවත - ක්‍රිෂ්ණ ලොජ් අසල |
| 14 | 10-D | දකුණු පටු මාවත-නව වෙළඳ සංකීර්ණය ඉදිරිපිට |
| 15 | 11 | සෙන්ට්‍රල් රෝහල ඉදිරිපිට (ද ෆිනෑන්ස් අසල) |
| 16 | 12 | රජ වීදිය-පළාත් සභා ගොඩනැගිල්ල ඉදිරිපිට |
| 17 | 13 | බදුලුපිටිය ප්‍රජා ශාලාව අසල |
| 18 | 14 | නව පස්සර පාර (මුතියංගන විහාරස්ථානය ඉදිරිපිට) |
| 19 | 15 | මුතියංගන විහාරය ඉදිරිපිට (ප්‍රධාන ප්‍රවේශ මාර්ගය දකුණු පස) |
| 20 | 16 | දුම්රිය පොළ පාර - පීපල්ස් ස්ටුඩියෝ අසල |
| 21 | 17 | පහල රජ වීදිය-සුජාතා විදුහල අසල |
| 22 | 18 | දුම්රිය ස්ථානයට හැරෙන පාරේ දකුණු පස |
| 23 | 19 | රේස්කෝස් පාර - කාර්ගිල්ස් ඉදිරිපිට |
| 24 | 20 | මුතියංගන පාර ලෝකා ස්ටෝර්ස් අසල |
| 25 | 21 | මුතියංගනය පාර-දේවාල වීදිය අසල |
| 26 | 22 | කිංග්ස් හන්දිය - ධර්මදූත පාර දෙපස |
| 27 | 23 | බොම්බෙ හෝටල් හංදිය |
| 28 | 24 | මුතියංගනය පාර - මොඩර්න් කම්ප්ලෙක්ස් ඉදිරිපිට |
| 29 | 25 | මුතියංගනය පාර - නන්දන හෝටලය ඉදිරිපිට |
| 30 | 26 | දෙයියන්වෙල ප්‍රජා ශාලාව අසල |
| 31 | 27 | බදුලුපිටිය ජල ටැංකිය අසල |
| 32 | 28 | බදුලුපිටිය අත්වැල් පාලම අසල |
| 33 | 29 | කයිලගොඩ පාර - වැඩිහිටි නිවාසය අසල |
| 34 | 30 | කයිලගොඩ හන්දිය |
| 35 | 31 | මහියංගන පාර - ගල්පිහිල්ල අසල |
| 36 | 32 | කැප්පෙටිපොල පාර - ඔරලෝසු කණුව අසල |
| 37 | 33 | පශු වෛද්‍ය කාර්යාලය අසල |
| 38 | 34 | තැපැල්හල පාර - ඌව පළාත් නියෝජ්‍ය තැපැල්පති කාර්යාලය අසල |
| 39 | 35 | තැපැල් හල පාර-පහල කොටස |
| 40 | 36 | කොමර්ෂල් කෙඩිට් ඉදිරිපිට |
| 41 | 37 | කැප්පෙටිපොල පාර (විදේශ සේවා කාර්යාලය ඉදිරිපිට) |
| 42 | 38 | ක්ලිනික් පාර - රිවර් වීව් ගොඩනැගිල්ල ඉදිරිපිට |
| 43 | 39 | කැප්පෙටිපොල පාර විශාඛා විදුහල් පැති බැම්ම අසල |
| 44 | 40 | උදය රාජ මාවත |
| 45 | 41 | ආර්. එච්. ගුණවර්ධන මාවත |
| 46 | 42 | බදුල්ල මහා රෝහල - මෘත ශරීරාගාරය අසල |
| 47 | 43 | ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව අසල |
| 48 | 44 | මහියංගණය පාර මැදපතන හන්දිය |
| 49 | 45 | සිද්ධාර්ථ විදුහල අසල |
| 50 | 46 | රත්වත්ත මාවත හන්දිය |
| 51 | 47 | රාහුල විදුහල අසල |
| 52 | 48 | මහියංගණ පාර - ශාන්ත මාර්ක්ස් දෙව් මැදුර ඉදිරිපිට |
| 53 | 49 | උදයරාජ මාවත - සෙන්ට්‍රල් ෆිනෑන්ස් අසල |
| 54 | 50 | හිඳගොඩ බෝගහ හන්දිය අසල |
| 55 | 51 | මුස්ලිම් පල්ලිය පාර රණසිංහ මෙඩිකල්ස් ඉදිරිපිට |
| 56 | 52 | බැංකුව පාර ලංකා බැංකුව ඉදිරිපිට |
| 57 | 53 | කොකෝවත්ත පාර - පී. කේ. මෝටර්ස් අසල |
| 58 | 54 | හිඳගොඩ විහාරස්ථානය ඉදිරිපිට |
| 59 | 55 | බස් සමවාය ඉදිරිපිට |
| 60 | 56 | පස්සර පාර - කෞතුකාගාරය ඉදිරිපිට |
| 61 | 57 | ධර්මදූත පාර දන්ත ශල්‍යාගාරය අසල |
| 62 | 58 | ජා ඇල හෝටලය අසල |
| 63 | 59 | ඌව විදුහල පාර |
| 64 | 60 | බදුලුපිටිය පාර (බන්ධනාගාරය නිල නිවස ඉදිරිපිට) |

02. බදුල්ල මහා නගර සභාවේ අනුමත වෑන් රථ ගාල් ලේඛනය :

| අනු. අංකය | රථ ගාලේ අංකය | රථ ගාලේ නම |
|---|---|---|
| 01 | 01 | හෙද විදුහලේ දකුණු ගේට්ටු කුළුණේ සිට පිං අරාව දෙසට |
| 02 | 02 | වෙලේ කඩේ නව වෙළඳ සංකීර්ණය ඉදිරිපිට බණ්ඩාරවෙල පාරට මුහුණලා (දකුණු පස) |
| 03 | 03 | උතුරු පටුමාවත ආයුර්වේද ගේට්ටුව අවහිර නොවන ලෙස |
| 04 | 04 | දකුණු පටු මාවත නව වෙළඳ සංකීර්ණයට ඇතුල්වන ස්ථානය අවහිර නොවන ලෙස දෙපස |
| 05 | 05 | බස් නැවතුම්පල ඉදිරිපිට දකුණු පටු මාවත ආසන්නයේ ලොතරැයි කුඩුවට 4'x 4'ප්‍රමාණයන් තබා නව වෙළඳ සංකීර්ණයට ඇතුළුවන ගේට්ටුව දක්වා |
| 06 | 06 | දුම්රියපළ පාර ආරම්භයේ ඔර්ලෝසු කණුව අසල (ජනාධිපති පිළිරුව දකුණු පස) |
| 07 | 07 | උදයරාජ මාවත ආදායම් බදු කාර්යාලයේ බැම්ම අසල |
| 08 | 08 | රජ වීදිය මැග්නට් වෙළඳසැලේ සිට දකුණු දෙසට |

03. බදුල්ල මහා නගර සභාවේ අනුමත ලොරි, වැලි ලොරි හා ට්‍රැක්ටර් රථ ගාල් ලේඛනය :

| අනු. අංකය | රථ ගාලේ අංකය | රථ ගාලේ නම |
|---|---|---|
| 01 | 01 | මුතියංගණ පටුමගෙහි විශ්‍රාම ශාලාව අසල පාලම දක්වා |

07-648

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.